# <u>බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව.</u>

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.06.26

වේලාව : පෙ.ව.11.30

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

<u>සහභාගීත්වය:-</u>

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | - | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. | ගරු උපසභාපති | - | සුමේද චමින්ද බස්නායක මැතිතුමා |
| 03. | ගරු නගර සභා මන්ත්‍රී | - | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 04. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. | ගරු නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 06. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07. | ගරු නගර සභා මන්ත්‍රී | - | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 08. | ගරු නගර සභා මන්ත්‍රී | - | විමලසේන වැවේගෙදර මැතිතුමා. |

<u>සහභාගීනොවූවෝ:-</u>

01. ගරු නගර සභා මන්ත්‍රී - යූ.එච්.ගාමිණී මැතිතුමා

<u>නිලධාරී සහභාගීත්වය:-</u>

01. නාගරික ලේකම් - ආර්.ඩී.නලින් පුෂ්ප කුමාර මහතා

(01) <u>ආගම සිහිකිරීම:</u>

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) <u>ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:</u>

ජාතික සවිය ගම නැගුම වැඩ සටහන යටතේ, නගර සභා බලප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා ග්‍රාම සේවා වසම් 06 ලක්ෂ 05 ක මුදලක් වෙන්ව ඇති බව ප්‍රකාශ කරන ලදි.
තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා, සබරගමුව හා උතුරු මැද පළාත් සභා විසුරුවා හැර තිබෙන අතර, ඉදිරියේ දී මෙම පළාත් සභාවන් දෙක සඳහා මැතිවරණයක් පැවැත්වීමට රජය තීරණය කර ඇති බව දැන්විය. නැගෙනහිරි

පළාතේ පැවැත් වූ මැතිවරණයෙන් මෙම රජයට විශාල ජයග්‍රහණයක් හිමි වූ අතර, ඒ තුලින් රජයේ ස්ථාවරභාවය තවදුරටත් තහවුරු ඇතැයි පැවසූ ගරු සභාපතිතුමා, අතිගරු ජනාධිපතිතුමාගේ නිවැරදි දේශපාලන නායකත්වය මත නැගෙනහිර පළාතේ සිදුකරන යුද්ධය සැබෑ යුද්ධයක් ලෙස කරගෙන යනු අතරම, රටේ සංවර්ධන ක්‍රියාවලිය ද ඉතා සාර්ථකව ඉටුකරගෙන යනු ලබන බවත්, ඒ සම්බන්ධව මෙම නගර සභාවේ සුභාශිංසනය අතිගරු ජනාධිපතිතුමා වෙත පළකර සිටින බව දැන්වීය.
සබරගමුව පළාත් සභා මැතිවරණයට බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශයෙන් අපේක්ෂකයින් කිහිප දෙනෙකු ඉදිරිපත් වන බව දැනගැනීමට තිබෙන බවත්, තමාද අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත්වීමට බලාපොරොත්තු වන බව සඳහන් කල ගරු සභාපතිතුමා, එක්සත් ජනතා සංධානයේ ජය තහවුරු කිරීම සඳහා සියලුම අපේක්ෂකයින් ඉතා සහයෝගීව කටයුතු කල යුතු තිබෙන බවත්, ඒතුලින් බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට දැනෙන සංවර්ධන කාර්යය ඉටුකිරීමට අවස්ථාව තිබෙන බව දන්වමි, , සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

05:01 <u>**එක්සත් නගර සහ පළාත් පාලන ආයතනයේ දෙවැනි වාර්ෂික සමුළුව ජ් 2008 ජුලි මස 15-18 තායිලන්තය.**</u>

උක්ත කරුණට අදාළව ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරක හේමයන්ති ගුණසේකර මහත්මිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ආසියා පැසිෆික් කලාපීය සංගමය මගින් සංවිධානය කරන දෙවැනි වාර්ෂික සමුළුව 2008 ජුලි 15 සිට 18 දක්වා තායිලන්තයේ පටායා නුවර ප්‍රදර්ශන සහ සමුළු ශාලාවේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත්, එම සමුළුවේ තේමාව වී ඇත්තේ .. තිරසාර ලෝකයක් උදෙසා තිරසාර නගර සහ පළාත් පාලනය .. වේ.

<u>ඒ සඳහා වන මූලික වියදම්:-</u>

කොළඹ -බැංකොක් - පටායා සහ නැවත පැමිණීමේ ගුවන් විදයම
රු.40 450

( සහභාගීවන සංඛ්‍යාව අනුව මෙම මුදල මුදල අඩුවිය හැකිය.)
වීසා ගාස්තු රු.4000

වැඩ මුළු ගාස්තු ඇ.ඩො. 350 රු.38500

වැඩ මුළු පැවැත්වෙන දිනවල සියලු වියදම් මෙයට ඇතුළත්ය. මුළු වියදම( නවාතැන් පහසුකම්
හැර ) 82950/- නවාතැන් පහසුකම් තමන් තීරණය කල යුතු අතර, ගුවන් තොටුපලේ සිට හෝටලය සඳහා යෑමට සහ ඒමට ප්‍රවාහන පහසුකම් නොමිලයේ සැපයෙන අතර, මෙම සමුළුවට සහභාගීවීමට අපේක්ෂා කරන්නේ

නම්, ජුනි 25 දිනට පෙර අදාල තොරතුරු ෆැක්ස් මගින් හෝ ඊ-මේල් මගින් දන්වන ලෙස එමගින් ඉල්ලා තිබෙන බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කර සිටින ලදී.

මේ පිළිබඳව සාකච්ඡා කල සභාව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව මෙම සභාවේ ගරු සභාපතිතුමා හා ලේකම්වරයා මෙම සමුළුව සඳහා සහභාගීකරවීම සුදුසු බවත්, වැඩ මුළුව පැවැත්වෙන කාලයට නිවාඩු අනුමත කිරීමටත්, මේ සඳහා වන මූලික වියදම් අයවැය ලේඛණයේ වැය ශීර්ෂ 1:1–423 (සභාපති ගමන්) මගින් ගෙවීමටත් ඒකමතිකව තීරණය කරන ලදී.

05:02 <u>විද්‍යුත් පුස්තකාලය සඳහා පරිගණක ලබාගැනීම:</u>

උක්ත කරුණට අදාලව, පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් 'සභාගත කරන ලදී.

විද්‍යුත් පුස්තකාලයට එකවිට කිහිපදෙනෙකු පැමිණ විට භාවිතා කිරීමට දැනට ඇති පරිගණක ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බවත්, විශේෂයෙන් ඉන්ටර්නෙට් භාවිතය සඳහා ද ජනතාව පැමිණි විට පරිගණක නොමැති නිසා, ඔවුන් ආපසු යන අවස්ථාව තිබෙන බව එමගින් දන්වා තිබිණ.

පුවත්පත් දැන්වීමක් පළකර මිළ ගණන් ලබාගෙන සුදුසු පරිගණක ලබාගැනීමට තීරණය කරන ලදී.

05:03 <u>පරිගණක සම්පත් මධ්‍යස්ථානයක්/තොරතුරු මධ්‍යස්ථානයක්/ **e-BALNGODA** තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතියේ මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.</u>

ඉහත මධ්‍යස්ථානය ආරම්භ කිරීම මගින් බලන්ගොඩ ජනතාවට ,රාජ්‍ය ආයතන හා සේවා පිළිබඳ තොරතුරු මෙන්ම විවිධ පර්යේෂණ,නිබන්ධන සඳහා තොරතුරු ලබාගැනීම ද සිදුකල හැකි බවත්, එසේම e-BALNGODA තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පහසුවීමද ප්‍රදේශයේ ජනතාවට තොරතුරු තාක්ෂණ සම්පත් අඩු මුදලට පරිහරණය කිරීමට ද මෙය මහඟු අවස්ථාවක් බව දන්වමින් පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු විසින් 2008.06.24 දිනැතිව දන්වා තිබෙන බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කර සිටින ලදී.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතා සම්පූර්ණ කිරීමට තීරණය කරන ලදි.

05:04 <u>අතුරු පාරක් නවීකරණය කරගැනීම:</u>

බලන්ගොඩ ඇල්ලෙපොල සරස්වතීපාරේ කේ.ඩබ්.සුනිල් ජයවික්‍රම මහතාගේ නිවස අසලින් ජී.යසපාල මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය ගමන්කිරීමට නොහැකිව අබලන් වී ඇති බැවින්, එය සකස් කරදෙන ලෙසත්, මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වය ලබාදිය හැකි අතර, නගර සභාවෙන් සිමෙන්ති මිශ්‍රකරන යන්ත්‍රය හා අවශ්‍ය ද්‍රව්‍ය ලබාදෙන ලෙස ප්‍රදේශවාසීන් විසින් 'එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත දන්වන ලදී.

මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට යොමුකිරීමට තීරණය කරන ලදී.

05:05 <u>පල්ලෙවෙල පාරේ ඉතිරි කොටස සාදා ගැනීම:</u>

ඉහත මාර්ගය සකස් කරදෙන ලෙස ඉල්ලා, බලන්ගොඩ ,පල්ලෙවෙල ,රාස්සගල ගම්වාසීන් විසින් එවා ඇති 2008.06.25 දිනැති ලිපිය සභාගත කරන ලදුව,

ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට යොමු කිරීමට තීරණය කරන ලදී.

05:06 **<u>2008 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ සංවර්ධන සැලැස්ම පළාත් සභා උපමාන පාදක අරමුදල- ඇස්තමේන්තු කැඳවීම:</u>**

2008.06.10 දින සිට සබරගමුව පළාත් සභාව විසුරුවා ඇති නිසා දැනට ඇස්තමේන්තු කැඳවා ඇති එහෙත්, මෙතෙක් ඇස්තමේන්තු පිළියෙළ නොකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම තාවකාලිකව නතර කරන ලෙස දන්වා සබරගමුව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් විසින් එවා ඇති 2008.06.18 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

05:07 <u>බලන්ගොඩ නගර සභා සීමාව තුළ ඔළුගන්තොට සෙලෝවත්ත පාරේ ගොඩැල්ල යන ස්ථානයේ නිවාස වලට යාමට පාරක් සකස්කරගැනීම:</u>

ඉහත සඳහන් මාර්ගය සෝදාපාලුවට ලක්ව ඇති බැවින්, එය පිළිසකර කරදෙන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරනු ලදුව, ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට යොමුකිරීම සුදුසු බවට සභාව තිරණය කරන ලදී.

05:08 **<u>2008.06.14 දින පවත්වනු ලැබූ ජන සභා රැස්වීම:</u>**

බලන්ගොඩ බුලත්ගම අස්වැද්දුම එපිටපැත්ත ප්‍රදේශවාසීන්ගේ සහභාගීත්වයෙන් 2008.06.14 දින පවත්වනු ලැබූ ජනසභා රැස්වීමේ වාර්තාව සභාගත කිරීම සඳහා එවා ඇති බව දන්වමින් ලේකම් මහතා එම වාර්තාව සභාගත කරන ලදී.

එමගින් බුලත්ගම ඇස්වැද්දුම එපිටපැත්ත මාර්ගය පිලිසිකර කිරීම සඳහා ප්‍රදේශවාසීන්ගේ ශ්‍රමදායකත්වය 50% ක් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර, මෙම සභාව මගින් ගල්,වැලි හා වෙනත් උපකරණ ,භාණ්ඩ හා රුපියල් ලක්ෂයක මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති බව දැනුම් දෙන ලද අතර, අදාල සංවර්ධන කාර්යය ඉටුකරගැනිම සඳහා සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය නොමිලයේ ලබාදීමට තීරණය කරන ලදී.

05:09 <u>සදුන්ගම ඉහල කොටස කොන්ක්‍රීට් කිරීම:</u>

උක්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡාවක් කැඳවූ අතර, එහිදී පහත සඳහන් දායකත්වයන් නගර සභාව මගින් ලබාගැනීමට තීරණය කල බව දන්වමින්, ප්‍රදේශවාසීන් විසින් එවා ඇති වාර්තාවක් සභාගත කරන ලදි.

01. ජේ.සී.බී.යන්ත්‍රය
02. කොන්ක්‍රීට් මිශ්‍රරය.
03. ජල බවුසරය.
04. අගල් 4 ගල් කියුබ් 10
05. අගල් 3/4 ගල් කියුබ් 04
06. වැලි කියුබ් 10

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, සභාව සතු ජේ.සී.බී.යන්ත්‍රය/කොන්ක්‍රීට් මිශ්‍රවරය හා ජල බවුසරය නොමිලයේ ලබාදීමට තීරණය කරන ලදි.

05:10 <u>නාය යෑමේ තර්ජණයකට ලක්ව ඇති ඉඩම සම්බන්ධවයි:</u>

ඉහත කාරණය සම්බන්ධව බලන්ගොඩ, උඩ ඇල්ලෙපොල,සරස්වතීපාර අංක-10/5 දරණ ලිපිනයේ පදිංචි කේ.කේ.ජෝශප් පෙරේරා මහතා විසින් එවා ඇති 2008.06.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් තමාගේ ඉඩම නාය යෑමේ තර්ජණයකට ලක්ව ඇති බවත්, සිය පුතුන් දෙදෙනා විසින් එම ඉඩමේ ඉදිකල එක් නිවසක් සම්පුර්ණයෙන්ම කඩා වැටුණු අතර, අනෙක් නිවාස දෙක පිපිරීමට ලක්ව ඇති බවත්, අවට නිවෙස් වල අපජලය හා වැසිජලය මෙම ඉඩමට ගලාඑන බවත්, එම ජලය බැස්සවීමට විධිමත් ක්‍රමයක් සකස් කර නොමැති නිසා, තමා ඉමහත් ගැටළු රැසකට මුහුණ පා ඇති බව වාර්තා කර තිබුණි.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව අදාල සංවර්ධන කාර්යය ඉටුකිරීම සදහා ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට යොමුකිරීමට තීරණය කරන ලදී.

05:11 <u>සරසවි කලායතනයේ පංති පැවැත්වීම සදහා නගර සභා පෙර පාසල් ගොඩනැගිල්ල ලබාගැනීම:</u>

ඉහත සදහන් කලායතනයේ පංති පැවැත්වීම සදහා නගර සභා පෙර පාසල් ගොඩනැගිල්ල සතියේ සෑම සෙනසුරාදා හා ඉරිදා දිනයකම( 2008.07.05) වෙන්කර දෙන ලෙස ඉල්ලා කලායතනාධිපතිනිය විසින් එවා ඇති ලිපියක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සෑම සෙනසුරාදා හා ඉරිදා දින දෙක දී පමණක් පංති පැවැත්වීම සදහා අවසර ලබාදීමට තීරණය කරන ලදී.

05:12 <u>බදු ගෙවීම සදහා දී ඇති කාලය දිර්ඝ කරගැනීම:</u>

උක්ත හිසින් යුතුව බලන්ගොඩ,හුණුකුඹුර අංක.28 දරණ ලිපිනයේ පදිංචි සලාහුදීන් නජ්බිදින් මහතා විසින් එවා ඇති ලිපියක් සභාවට ඉදිරිපත් කරන ලදී.

හිග වරිපනම් බදු සියල්ල දින හතක කාලයක් තුල ගෙවන ලෙස මෙම සභාව විසින් තමා වෙත දන්වා ඇති බවත්, එම මුදල ගෙවීමට දින 15 ක සහන කාලයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබුණු අතර, අදාල හිග මුදල ගෙවීමට දින 15 ක සහන කාලයක් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:13 <u>ගම නැගුම වැඩ සටහන - 2008 වර්ෂය</u>
<u>හදුනාගත් ව්‍යාපෘති යෝජනා සදහා ඇස්තමේන්තු සකස් කිරීම:</u>

උක්ත කරුණට අදාළව ප්‍රාදේශීය ලේකම්,බලන්ගොඩ විසින් එවා ඇති 2008.06.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ජනසභා මගින් තෝරාගන්නා ලද ව්‍යාපෘති යෝජනා අතරින් මෙම නගර සභාවට අදාල වු සංවර්ධන යෝජනාව නගර සභාව මගින් ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මකකිරීමට අනුමැතිය ලබාදෙන්නේ ද යන්න විමසා තිබිණි. අදාල සංවර්ධන කාර්යය මෙම නගර සභාව මගින් ඉටුකරන බව දන්වා යැවීමට තීරණය කරන ලදී.

05:14 <u>අනවසර ඉඩම් වල අයිතිය තහවුරු කිරීම:</u>

කිරිදිගල වසමේ දොරවෙල පාරේ පරණ පොල අසල( ගල උඩ ) පදිංචිකරුවන් වසර 20 ක පමණ කාලයක සිට එම ස්ථානයේ නිවාස තනා පදිංචිව සිටින බවත්, මෙම නගර සභාව විසින් ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කරන බැවින්, නිවාස වැඩි දියුණු නොකරන ලෙස දැණුම් දී ඇති බව බවත්, නගර සභාව විසින් ඔවුන්ට එසේ දැණුම්දීමක් කර ඇද්ද යන්න පිළිබඳවත්, එම ඉඩම්වල අයිතිය පිළිබදවත් වාර්තාවක් තමා වෙත එවනලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් , බලන්ගොඩ විසින් එවා ඇති 2008.06.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව, පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන එම ඉඩම් මැන බදුක්‍රමයකට ලබාදීමට තිරණය කරන ලදී.

05:15 ඇල මාර්ගය සකස්කරගැනීම:

බලන්ගොඩ ගොවිජන බලප්‍රදේශයේ බළන්ගොඩ නගර සභා සීමාව තුළ කුමාරගම වසමේ උඩ ඇල්ලෙපොල පිහිටි ළිදමුල්ල ,මැදකැල්ල නැමැති කුඹුරු ඉඩමට ජලය ලබාගන්නා ඇල මාර්ගය අවහිර කර 2001 වර්ෂයේ දී බලන්ගොඩ නගර සභාව විශාල පැති බැම්මක් ඉදිකල නිසා , වසර 07 සිට , එම කුඹුර වැඩකිරීමට නොහැකිව පවතින බවත්, තමා සමෘද්ධිලාභියෙකු වන අතර, ජීවත්වීමට ද කිසිදු රැකියාවක් නොමැති බවත්, එබැවින්, එම ඇල මාර්ගය සකස් කරදෙන ලෙස ඉල්ලා, බලන්ගොඩ,උඩ ඇල්ලෙපොල,අංකඃ426/2 දරණ ලිපිනයේ පදිංචි කේ.ජී.ගුණසේන යන අය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සම්බන්ධව වැඩ අධිකාරී මහතා ලවා පරීක්ෂා කර වාර්තාවක් ලබාගැනීමට තිරණය කරන ලදී.

05:16 විසිතුරු භාණ්ඩ ප්‍රදර්ශණයක් පැවැත්වීම සඳහා ස්ථානයක් ලබාගැනීම:

බලන්ගොඩ,බලගමුල අංක,25 සේනක පෙදෙස, යන ලිපිනයේ පදිංචි ඩබ්.ජී.අයි.මාලනී යන අය ස්වංරැකියාවක් ලෙස ඉහත ව්‍යාපාරය කරගෙන යනු ලබන බවත්, එම භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස ඉල්ලා ඉහත කි අය විසින් ඉදිරිපත් කර ඇති 2008.06.23 දිනැති ලිපිය සභාගත කරන ලදුව, බස්නැවතුම්පල................................ සතියකට ලබාදීමට තීරණය කරන ලදි.

05:17 පොදු පහසුකම් සඳහා වැසිකිලි 04 ක් ඉදිකිරීම:

බලන්ගොඩ,ශ්‍රී සුදර්ශන මහාවිහාරයේ අලුතින් ධර්මශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීමත් සමග දිනපතා විවිධ කටයුතු හා උත්සව සඳහා විශාල පිරිසක් පැමිණෙන බැවින් ද අලුතින් ආරම්භ කල දහම් පාසලේ දරුවන් 600 කට ආසන්න පිරිසක් සිටින බැවින් ද, ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා වැසිකිලි පහසුකම් නොමැති බැවින්, වැසිකිලි පහසුකම් කඩිනමින් ඇතිකිරීම අත්‍යාවශ්‍ය සඳහන් කරමින්, එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගෙන වැසිකිලි 02 ක් ඉදිකරදීම සුදුසු බවට සභාව තීරණය කරන ලදි.

05:18 2007 භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව වෙන්දිසිය සඳහා දිනයක් ලබාගැනීම:

2007 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව වෙන්දිසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව සමඟ ඒ සඳහා දිනයක් ලබාදෙන ලෙස ඉල්ලමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, 2008.07.10 වන දින පෙ.ව.10.00 ට අදාල වෙන්දේසිය නගර සභා කාර්යාල පරිශ්‍රයේ දී පැවැත්වීමට තීරණය කරන ලදී.

05:19 සුසාන භූමිය අසලින් ඇති සරස්වතී උඩ පාර කොන්ක්‍රීට් කිරීමට පෙර වතුර බැසයාමේ කාණුව සකස් කිරීම:

උක්ත කරුණට අදාළව බලන්ගොඩ ,සරස්වතීවත්ත ප්‍රදේශවාසීන් විසින් එවා ඇති 2008.06.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත සඳහන් පාරේ එක් බෑවුමක පිහිටි ගෙවල් සමූහයක් නායයාමේ තර්ජණයකට ලක්ව ඇති බවත්, එම පාර කොන්ක්‍රීට්කලහොත්, එම පාරට සම්බන්ධ පඩිපෙළ දෙපස ගෙවල් ද නාය යාමේ තර්ජණයකට මුහුණ පෑමේ

ඉඩකඩ වැඩිවන බැවින්, ඉහත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට පෙර වතුර බැසයාමේ කාණුව සකස් කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.
ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට යොමුකිරීමට තීරණය කරන ලදී.

05:20 <u>ඇල්ලෙපොල මාලිගාතැන්න කඩේ අසලින් ඉහල පාර සරස්වතීවත්ත පාරට සම්බන්ධ පාර කොන්ක්‍රීට් කිරීම:</u>

ගම නැගුම ව්‍යාපෘතිය යටතේ උක්ත කර්මාන්තයේ වැඩ අවසන් කර ඇති බැවින්, එහි කොටස් මුදල ලබාදෙන ලෙස ඉල්ලා, තලංගම පැරකුම් ගොවි සංවිධානයේ සභාපති විසින් එවා ඇති 2008.06.19 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදුව, රු.10000/- ක අත්තිකාරමක් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:21 <u>පාර සකස් කරගැනිම:</u>

**උක්ත මැයෙන් යුතුව බලන්**ගොඩ ,වැකුඹුර ප්‍රදේශවාසීන් විසින් එවා ඇති 2008.06.13 දිනැති ලිපිය සභාගත කරන ලදි.
වැකුඹුර ගමේ ගම්සභා පාර සහ අනෙකුත් අතුරු පාරවල් දෙක අබලන් වී ඇති නිසා, මහජනතාවට ගමන්කිරීමට නොහැකිව තිබෙන බවත්, එබැවින්, ප්‍රධාන පාරවල් සමඟ මෙම මාර්ග දෙකද සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත ප්‍රකාශ කරන ලදුව, ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදි.

05:22 <u>පාර පිළිසකර කරගැනීම:</u>

දෙහිගස්තලාව 1 පටුමග කොන්ක්‍රීට් කරදෙන ලෙස ඉල්ලා, දෙහිගස්තලාව 1 පටුමග ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපියක් ද, දුනුමඩලගහවත්ත පාර 11 පටුමග කොන්ක්‍රීට් කර සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා එම ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපි සභාගත කරන ලදුව, එම මාර්ග දෙක සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට යොමුකිරීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:23 <u>මාර්ගය කොන්ක්‍රීට් දමා පිළිසකර කරගැනීම:</u>

උක්ත කරුණට අදාළව, බලන්ගොඩ,වෙටිනොල් පාර ජල ටැංකිය අසල යන ලිපිනයේ පදිංචි නෝබට් ස්ටැන්ලි ලුවිස් යන අය විසින් එවා ඇති 2008.06.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.
එමගින් වෙටිනෝල් පාර ජල ටැංකිය අසලින් ඇති මාර්ගය කොන්ක්‍රීට් දමා පිළිසකර කරදෙන ලෙස ඉල්ලා තිබුණි.
අදාල සංවර්ධනය කාර්යය ඉටුකිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර කර්මාන්ත කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

06. <u>මුදල් ගෙවීම් අනුමත කිරීම:</u>

| | | |
|---|---|---|
| 01. | විවිධ සේවා සමුපකාර සමිතිය ,ඉඹුල්පේ<br>2008.05.15 දින සිට 2008.05.23 දක්වා ඉන්ධන<br>බිල්පත් පියවීම. | රු. 119773.10 |
| 02. | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2008.04.01 දින සිට 2008.04.30 දින දක්වා<br>එකතු කල අගය මත බදුගෙවීම. | රු. 169223.00 |
| 03. | කේ.ඩී.නිශාන්ත<br>කාර්යාලීය දුරකථන පද්ධතිය නඩත්තු කිරීමේ<br>ගිවිසුම් සඳහා ගෙවීම. | රු. 19000.00 |

| | | |
|---|---|---|
| 04. | යු.කේ.ආර්.සුගතපාල<br>නිල නිවසේ නාන කාමරය සඳහා පිඟන් ගඩොල් ලබාගැනීම. | රු. 19810.00 |
| 05. | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2008 ජනවාරි සිට අප්‍රේල් දක්වා නාගරික මන්ත්‍රී දුරකථන බිල්පත් පියවීම. | රු. 36619.31 |
| 06. | එම්.ජී.පියසේන<br>බස්ගාල් ගාස්තු කොමිස් මුදල් ගෙවීම. | රු. 13981.30 |
| 07. | ජයන්ති ටයර් සෙන්ටර්<br>37-7933 ට්‍රැක්ටර් සඳහා ටයර් 02 ලබාගැනීම | රු. 15800.00 |
| 08. | ඩී.ඒ.චතුරානි<br>නගර සභාවට මල්පැල ලබාගැනීම. | රු. 36700.00 |
| 09. | මෙට්‍රෝපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ් | රු. 12650.00 |
| 10. | ඩැක්ස් ඉංජිනියරින් කෝපරේෂන්<br>බොබ් කැට් යන්ත්‍ර මීටර් පැය 250 සේවා සඳහා ගෙවීම. | රු. 25350.00 |
| 11. | ඒ.විජේසුන්දර<br>ගල්රෝල සඳහා ගෙවීම. | රු. 33000.00 |
| 12. | ටී.කේ.සී.මුවංගල<br>සිමෙන්ති රිජිෆෝම් ෂීට් හා විල්බැරෝ රෝද 01 ක් ලබාගැනීම. | රු. 42880.00 |
| 13. | එච්.කේ.නිමාලි කෞෂල්‍යා | රු. 10000.00 |
| 14. | ආනන්ද හාඩ්වෙයාර්<br>සිමෙන්ති ලබාගැනීම. | රු. 79900.00 |
| 15. | බී.ගුණරත්න<br>2008.06.01 සිට 2008.06.15 දක්වා කසල බවත් කිරීමේ ගාස්තු ගෙවීම. | රු. 86500.00 |
| 16. | සී/ස රත්නපුර දිස්ත්‍රික් ස.ණ.ස.<br>සංගමය ලිපිගොනු කවර 500 ක් ලබාගැනීම | රු. 16775.00 |
| 17. | නිව් රෝයල් ටිම්බර්<br>නිල නිවස සඳහා ලී ලබාගැනීම. | රු. 17750.00 |
| 18. | එච්.එල්.ඩබ්.ටිම්බර් ඩීලර්ස්<br>කර්මාන්ත අංශය සඳහා ද්‍රව්‍ය ලබාගැනීම | රු. 12203.00 |
| 19. | ඒ.එම්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>විදුලි බල්බ් ලබාගැනීම. | රු. 25860.00 |
| 20. | සී/ස ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය<br>2008.05.23 සිට 2008.05.29 දක්වා ඉන්ධන බිල් පියවීම. | රු. 187069.60 |
| 21. | සාමාන්‍යාධිකාරි , ලංකා විදුලිබල මන්ඩලය<br>2008 මැයි මස විදුලි බිල්පත් පියවීම. | රු. ................ |
| 22. | දේශීය ආදායම් කොමසාරිස්<br>2008.05.01 සිට 2008.05.31 දක්වා එකතු කල අගය මත බදු ගෙවීම. | රු. 256192.00 |
| 23. | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් | |

නගර සභාවේ දුරකථන බිල( මැයි මස )                රු. 14978.29

24. එච්.බී.ගුණරත්න
වැලි සැපයීම සඳහා ගෙවීම් කිරීම.                රු. 22800.00
මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. <u>ඇස්තමේන්තු අනුමත කිරීම:</u>
01. තලංගම වසම සපුගස්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම.                රු.222523.14

ඉහත කී කර්මාන්ත දෙකෙහි ඇස්තමේන්තුව අනුමත කල සභාව සෘජු කම්කරු ශ්‍රමය යටතේ මෙම කර්මාන්ත වල වැඩ ආරම්භ කිරීමට තීරණය කරන ලදී.

02. කරවිකැටිය ගල්වල පාරට හැරෙන හන්දියට යාව ඇති අතුරු මාර්ගය තාර දැමීම.                රු. 100671.19

14. <u>වෙනත් කරුණු:-</u>

14:01 <u>ගරු නගර සභා මන්ත්‍රී - ධර්මසේන සමරසිංහ මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බලන්ගොඩ සමාජ සේවා පදනම 18 වන වරටත් සංවිධානය කල පොසොන් මහා බත්දන්සල බලන්ගොඩ පොදු වෙළඳසල් ගොඩනැගිල්ලේ දී පැවැත්වූ බවත්, එම පුන්‍යමය කටයුත්ත සාර්ථකව කරගැනීම සඳහා මෙම නගර සභාවේ ගරු සභාපතිතුමා,ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය දැක් වූ සහයෝගයට සමාජ සේවා පදනමේ ගරු භාණ්ඩාගාරික ලෙස තමාගේ කෘතඥතාපූර්වක ස්තුතිය පිරිනමන බව දැන්වීය. කුමාරගම මාර්ගය සකස් කිරීම සම්බන්ධව සිය ස්තුතිය ගරු සභාපතිතුමන් වෙත පළකල ගරුමන්ත්‍රීතුමා, බලන්ගොඩ නගරයට රැස්වීම් ශාලාවක් නොමැතිවීම විශාල අඩුපාඩුවක්ව බවත්, එම අඩුපාඩුව සම්පූර්ණ කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

බලන්ගොඩ විදුලි පාරිභෝගිකයින්ට පැන නගින ගැටළු විසදා ගැනීමට පැල්මඩුල්ලේ කාර්යාලය වෙත යාමට සිදුව ඇති නිසා ඉමහත් අසීරුතාවකට ලක්ව ඇති බවත්, එබැවින්, බලන්ගොඩ ප්‍රදේශයේ විදුලි උප කාර්යාලයේ පවත්වාගෙන යාම සඳහා අදාල බලධාරීන්ගේ අවධානය යොමුකරවන ලෙස ඉල්ලා සිටින ලදී.

බලන්ගොඩ නගරයේ ග්‍රාම නිලධාරි මහතා නගරය තුළම පදිංචි වී සිටීමෙන් ජනතාවට පහසුවෙන් රාජකාරි ඉටුකරගත හැකි බවත්, එම නිසා නගර සභා නිල නිවසක් ඒ මහතා වෙත පදිංචිය සඳහා ලබාදීමට කටයුතු කිරීම මැනවි යැයි පවසමින් සිය කථාව අවසන් කරන ලදී.

14:02 <u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා:</u>

බලන්ගොඩ කල්තොට මාර්ගයේ ධාවනය කරනු ලබන පෞද්ගලික සහ ජනතාසන්තක ප්‍රවාහන සේවයට අයත් බස්රථ වලින් 75% ක ප්‍රමාණයක් නගරසේ ධාවන සැලැස්මට අනුව ධාවනය නොවන බවත්, එබැවින්, ඒ කෙරෙහි අවධානය යොමුකර එම බස් රථ සියල්ලම අදාල ධාවන සැලැස්මට අනුකූලව ධාවනය කරවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

14:03 <u>ගරු නගර සභා මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බලන්ගොඩ මූලික රෝහල ඉදිරිපිට කහඉර මත බස්රථ නැවැත්වීම සිදුකරනු ලබන බවත්, ඇතැම් බස්රථ රියදුරන් රෝහලට ප්‍රවිශ්ඨ වන මාර්ගය අවසර කර බස්රථ නැවැත්වීම සිදුකරනු ලබන බවත්. මෙම හේතු නිසා මහත් වූ අපහසුතා රැසකට මුහුණ පෑමට ජනතාවට සිදුව ඇති බවත් එබැවින්, ඒ කෙරෙහි අවධානය යොමු කර එම අපහසුතාව වලක්වාලීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.( මේ සම්බන්ධව පොලීසිය සමග සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දැන්විය.)

14:04 <u>ගරු නගර සභා මන්ත්‍රී, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, දැනට මාස 06 කට පමණ පෙර බලන්ගොඩ නව බස්නැවතුම්පල ගොඩනැගිල්ලේ උඩු මහලේ දී ර/බලන්ගොඩ බුද්ධ ජයන්ති විද්‍යාලයේ 11 වසර ඉගෙනුම ලැබූ ශිෂ්‍යාවක අතවරයකට ලක්ව ඇති බව දැන්විය.බස්නැවතුම්පල අප සියළු දෙනාගේම අවධානයට ලක්වන තැනක් බවත්, එවැනි ස්ථානයක මෙවැනි සිද්ධියක් සිදුවීම සම්බන්ධව කණගාටුවන අතර, නගර සභාව විසින් පාලනය කරනු ලබන ස්ථානයක මෙවැනි දේ සිදුවීමෙන් සභාව අපකීර්තියකට ලක්වන බවත්, එබැවින්, මින් ඉදිරියේ දී හෝ මෙවැනි දේ සිදුනොවීම සඳහා අවශ්‍ය ක්‍රියාමර්ග ගැනීම සුදුසු බව දැන්විය.

රාත්‍රී 9.00 පසුව බස්නැවතුම්පල උඩුමහලට පිවිසිය නොහැකි වන ආකාරයට ගේට්ටු දෙකක් සවිකිරීමට තීරණය කරන ලදි.

බලන්ගොඩ දෙමළ විද්‍යාල පාර කොන්ක්‍රීට් කිරීමේ කාර්යය ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබෙන බවත්, ඉක්මණින් එහි වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. පසුගිය සභා වාරයේ දී තමන් කුමාරගම පන්සලට වතුර මෝටරයක් හා ටැංකියක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කල බවත්, එම ඉල්ලීම ඉටුකර නොමැති නම්, ඒ පිළිබඳව නැවත අවධානය යොමුකර එම ඉල්ලීම ඉටුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

පළාත් පාලන ආයතන වල සභිකයින්ට ලැබෙන දුරකථන දීමනාව බිල්පත් පියවීමට කිසිසේත් ප්‍රමාණවත් නොවන බවත්, එම නිසා දුරකථන බිල්පත් පියවීමේ දීමනාව තවත් රු.500/- කින් හෝ වැඩිකරදෙන ලෙස අදාල බලධාරීන්ගෙන් ඉල්ලීමක් කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14:05 <u>ගරු නගර සභා මන්ත්‍රී, ඩබ්.විමලසේන මැතිතුමා:</u>

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, ඇල්ලෙපොල සරස්වතී මාර්ගයේ නිවස කිහිපයක් නාය යෑමේ තර්ජණයකට ලක්ව ඇති නිසා. එම නිවාස වල පදිංචි ජනතාව මහත් අන්තරාදායක තත්ත්වයකට මුහුණ දී ඇති බව පැවසිය. එබැවින්, එම ජනතාවට පදිංචිය සඳහා ඉඩම් කොටස් ලබාදෙන ලෙසත්, දැනට විකල්පයක් ලෙස අප ජලය හා වැසි ජලය ගලායාම සඳහා කාණුවක් සකස් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.( ඉහත කී ජනතාවට විකල්ප ඉඩම් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම් බලන්ගොඩ වෙතින් ඉල්ලීමක් කිරීමට තීරණය විය.)

මෙම නගර සභාව විසින් වැවේගෙදර මාර්ගයේ ඉදිකල පැති බැම්ම කඩා වැටී ඒ අවට තිබෙන කුඹුරු යටවී ගොවිජනතාවට සිය කෘෂිකාර්මික

කටයුතු ඉටුකර ගැනීමට නොහැකිව තිබෙන බව දැන්විය. ( මේ සම්බන්ධව පරීක්ෂා කර බලා ඇස්තමේන්තුවක් සකස් කරන ලෙස වැඩ අධිකාරි මහතා වෙත දැනුම් දීමට තීරණය විය.)

බලන්ගොඩ නගරයේ පහත සඳහන් ස්ථාන වල විදුලි පහන් නොමැති බව පෙන්වා දෙමින්, එම ස්ථාන වලට විදුලි පහන් සවිකිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව නිම කරන ලදී.

15. අවසානයඃ-

<u>ගරු සභාපති-ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ</u>

රැස්වීමට සහභාගිවී සහයෝගය දැක්වූ සියළු දෙනාටම සිය ස්තූතිය පළකරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව.2.00 ට පමණ අවසන් කරන ලදී.

2008.07.07වන දින
බළන්ගොඩ නගර සභාවේ දී ය.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.